පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
03

අවසාන වාර පරීක්ෂණය - 2016

ගණිතය

පාසලේ නම : .....

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : .....
.....

කාලය : පැය 1 ½යි.

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1) ඉලක්කමෙන් ලියන්න.

i. අසූ හතර - .....

ii. එකසිය දහය - .....

iii. තුන්සිය පහ - .....

(ල.6)

2) සංඛ්‍යා නාමය ලියන්න.

i. 68 - .....

ii. 120 - .....

(ල.4)

3) පහත සංඛ්‍යා විහිදුවා ලියන්න.

iii. 468 - .....

iv. 670 - .....

(ල.4)

4) 298 සංඛ්‍යාව පහත ගණක රාමුවේ නිරූපණය කරන්න.



(ල.2)

Education NCP - www.edncp.lk

5) ගණක රාමුවේ නිරූපිත සංඛ්‍යාව ලියන්න.

(i)



.....

(ii)



.....

(ල.4)

6) පහත සඳහන් ගැටලු විසඳන්න.

(i)

$$\begin{array}{r} 4\ 2 \\ +\ 1\ 3 \\ \hline \\ \hline \end{array}$$

(ii)

$$\begin{array}{r} 3\ 2 \\ +\ 7\ 0 \\ \hline \\ \hline \end{array}$$

(iii)

13 + 15 =

(iv)

$$\begin{array}{r} 1\ 4 \\ -\ \ 6 \\ \hline \\ \hline \end{array}$$

(v)

$$\begin{array}{r} 8\ 7 \\ -\ 2\ 5 \\ \hline \\ \hline \end{array}$$

(vi)

37 − ☐ = 12

(ල.12)

(vii) පහත දී ඇති ගුණන වගුවේ හිස්තැන් පුරවන්න.

x	2	5
1	2	.....
4	.....	20
3	6	.....

(ල.6)

Education NCP - www.edncp.lk

(viii) $2\overline{)15}$ විසඳන්න.

(ල.4)

7) රටාව තේරුම් ගෙන හිස්තැන් පුරවන්න.

i. 1 , 3 , 5 , 7 , ... , ...

ii. 25 , 30 , 35 , 40 , ... , ...

iii. 33 , 28 , 23 , 18 , ... , ...

(ල.6)

8) කුඩා ම සංඛ්‍යාව යටින් ඉරක් අඳින්න.

i. 78 , 75 , 72

ii. 358 , 385 , 359

(ල.3)

9) විශාල ම සංඛ්‍යාව තෝරා රවුම් කරන්න.

i. 58 , 59 , 55

ii. 781 , 718 , 871

(ල.3)

10) රවුම තුළ ඇති ඉලක්කම් ඇසුරින් පිළිතුරු ලියන්න.



i. රවුම තුළ ඇති ඉලක්කම් සියල්ල යොදාගෙන සෑදිය හැකි,

a) විශාල ම සංඛ්‍යාව කුමක් ද? .....

b) කුඩා ම සංඛ්‍යාව කුමක් ද? .....

c) එම සංඛ්‍යා දෙක අතර වෙනස කීය ද?

.....

(ල.6)

Education NCP - www.edncp.lk

11) ගැටලු විසඳන්න.

i. මා ළඟ ජම්බු ගෙඩි 37ක් ද, නංගී ළඟ ජම්බු ගෙඩි 25ක් ද ඇත. දෙදෙනා ළඟම ඇති ජම්බු ගෙඩි ගණන කොපමණ ද?

.....

ii. පොත් 18ක්, එක් අයෙකුට පොත් 3 බැගින් කී දෙනෙකුට දිය හැකි ද?

.....

iii. එක් සිසුවෙකුට කොඩි 2 බැගින් සිසුන් 8 දෙනෙකුට ලබා දීමට කොඩි කීයක් අවශ්‍ය ද?

.....

iv. පැන්සල් 22ක් පෙට්ටි 2කට සමාන ව ඇසිරූ විට එක් පෙට්ටියක ඇති පැන්සල් ගණන කීය ද?

.....

v. සිසිර ළඟ තිබූ පොත් ගණන 31 කි. ඉන් පොත් 15 ක් කවිඳුට ලබා දුන් පසු සිසිර ළඟ ඉතුරුවන පොත් ගණන කීය ද?

.....

(ල.10)

12) පහත සඳහන් මුදල් ප්‍රමාණ කාසිවලින් ගෙවිය හැකි ආකාර ඉදිරියෙන් ලියන්න.

මුදල	ගෙවිය හැකි ආකාරය (කාසිවලින්)
රුපියල් 5	
රුපියල් 7	
රුපියල් 9	

(ල.6)

Education NCP - www.edncp.lk

13) නිවැරදි පිළිතුර තිත් ඉරි මත ලියන්න.

i. සතියේ පළමු දවස කවදා ද?

.....

ii. ජූලි මාසයට පෙර මාසය කුමක් ද?

.....

iii. මාසයකට සති කීය ද?

.....

(ල.6)

14) දී ඇති ඝන වස්තුව ඇසුරින් පිළිතුරු සපයන්න.



i. මෙම ඝන වස්තුවේ නම කුමක් ද?

.....

ii. මෙම ඝන වස්තුවේ ඇති මුහුණත් ගණන කීය ද?

.....

(ල.4)

15) පහත දී ඇති රූපසටහන අනුව ළමයාට දකුණු පසින් ඇති රූපයට යටින් ඉරක් අඳින්න.





(ල.2)

16) දී ඇති ත්‍රිකෝණයේ පාද 3 ම දිගින් සමාන ය. එහි සමමිතික රේඛා 2ක් අඳින්න.



(ල.2)

Education NCP - www.edncp.lk

17) ප්‍රස්තාරය ඇසුරෙන් පිළිතුරු ලියන්න.

මල් වර්ගය	කැමති ශිෂ්‍යයන් ගණන
පිච්ච	
රෝස	
ඕකිඩ්	
අරලිය	

i. වැඩි දෙනෙක් කැමති මල් වර්ගය කුමක් ද?

.....

ii. රෝස මල්වලට කී දෙනෙක් කැමති ද?

.....

iii. පිච්ච මල්වලට හා අරලිය මල්වලට කී දෙනෙක් කැමති ද?

.....

iv. ඕකිඩ් මල්වලට වඩා කී දෙනෙක් අඩුවෙන් අරලිය මල්වලට කැමති ද?

.....

v. මල් වර්ග සියල්ලටම කැමති මුළු සිසුන් ගණන කීය ද?

.....

(ල.10)

Education NCP - www.edncp.lk